
පුංචි කුරුලු පැටවු
පී.ජී. ලවන්‍යා ද සිල්වා

# පුංචි කුරුළු පවුල

පී.ජී. ලවන්‍යා ද සිල්වා

2023

ISBN 978-624-208-040-6

# පිදුම

ජීවිතේ ජය ගන්න අත්වැල වෙන
මගේ ගුරුදෙගුරුන්
හට..........

# ස්තූතියි

මෙම පොත ලිවීමට උපදෙස් ලබා දුන්

සෙනවිරත්න ගුරුපියාණන්ටත්,

මාගේ 4 - E පන්තිභාර මානෙල් ගුරුමෑණියන්ටත්

මාගේ ආදරණීය දෙමාපියන්ටත්

මාගේ හදපිරි ස්තූතිය පුද කර සිටිමි.

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදූහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර
විදූහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-10-20

එකොමත් එක කාලයක කුරුළු ජෝඩුවක් ජීවත් වුණා. ටික කාලයක් යන කොට මේ දෙදෙනාට දරුවෝ දෙදෙනෙක් ඉපදුණා. මේ කුරුළු ජෝඩුව පැටව් දෙදෙනාව ආදරයෙන් බලාගත්තා. ඒ දෙන්නා තම දරුවන් රැක්කේ ඇස් දෙක වගේ. ඒ පැටව් දෙන්න හරිම දඟයි. දරුවෝ දෙන්නගේ මේ දඟ වැඩ දිහා බලා ගෙන කුරුළු අම්මා තාත්තාට මෙහෙම කිව්වා. '' මේ ඇහුණ ද ළමයි ගේ අප්පච්චි. මෙයාලා පියාඹන්න ඉගෙන ගන්නකම් අපි දෙන්නගෙන් එක්කෙනෙක් විතරක් කෑම හොයන්න යමු නේද?''

''එහෙම බය වෙන්න ඕනේ නෑ. එයාලා තනියම ජීවත් වෙන්න පුරුදු වෙන්න ඕනේ.'' එහෙම කියලා තාත්තා අම්මාවත් එක්කන් කෑම සොයා ගියා.



මේ කුරුළු පවුල ජීවත් වුණ කූඩුව තිබුණේ ගෙයක් අසල පොඩි පේර ගහක් මුදුනකයි. මේ ගෙදර හිටියා තරු කියලා පොඩි ගෑණු ළමයෙක්. කෑම සොයා ගෙන ඈතට ඉගිලිලා යන කුරුළු අම්මයි තාත්තයි දිහා තරු හොඳට බලාගෙන හිටියා. ඒ දෙන්න ගිය ගමන් තරු හෙමින් හෙමින් කුරුළු කූඩුව තියෙන ගහ ළඟට ළං වුණා.  තරුට පැටව් දෙන්න බලන්න හරි ආස හිතුණා. තරු ඉනිමඟක් ගෙනල්ලා ගහට නැගලා පැටව් දෙන්න අරං බිමට පැන්නා.



අම්මටත් නොදැනෙන්න පැටව් එක්ක සෙල්ලන් කරන්න පටන් ගත්තා. මෙහෙම සෙල්ලන් කර කර ඉන්න අතරේ අර කුරුළු අම්මයි තාත්තයි කෑම සොයා ගෙන කූඩුවට ආවා.''අපොයි දෙයියනේ කෝ මගේ දරුවෝ දෙන්නා'' කුරුළු අම්මා මහ හයියෙන් අඬන්න පටන් ගත්තා. කුරුළු තාත්තා එහෙ මෙහෙ ඉගිලෙමින් පැටව් හොයන්න ගත්තා. දෙන්නම මහ හයියෙන් කෑගැහුවා.

කුරුල්ලන්ගේ සද්දෙට ගේ ඇතුලේ හිටිය අම්මා දුවගෙන මිදුලට ආවා. '' තරු පුතේ ඔයා කොහෙද? ඇයි මේ කුරුල්ලෝ මෙච්චර සද්ද කරන්නේ'' තරුගේ අම්මා තරු හොයා ගෙන ගේ වටේ ගියා.

තරුව දැක්ක අම්මා පුදුම වුණා. " අනේ පුතේ ඔයා ඔය මොකද කරන්නේ? ඔයා ඔය පැටව් දෙන්නා ගත්ත නිසා තමා ඒ අම්මයි තාත්තයි අඬන්නේ." අම්මට තරු ගැන තරහකුත් ආවා. "අනේ අම්මේ මට මේ දෙන්නා ඕනේ" තරු අඬමින් කිව්වා. "පුතේ ඔයා කැමති ද අම්මයි අප්පච්චියි නැතුව ඉන්න. නෑ නේද? මේ පැටව්ටත් එයාගේ අම්මා තාත්තා ඕනේ." තරු අඬන දිහා බලාගෙන අම්මා කිව්වා."

" අනේ අම්මේ"

"පුතේ සත්තු දෙමාපියන්ගෙන් ඈත් කරලා හිරකරලා හදන්න හොඳ නෑ. පව් සිදු වෙනවා." එහෙම කියලා අම්මා පැටව් දෙන්න අරන් ගහ ළඟට ගියා. කුරුළු පැටව් දෙන්න දැක්ක අම්මයි තාත්තයි තරුලා ඉන්න තැන කැරකෙන්න පටන් ගත්තා.



“දැක්කද පුතේ එයාලා දෙන්නා මේ දරුවෝ දෙන්නට කොච්චර ආදරේද කියලා.” අම්මා එහෙම කියලා පැටව් දෙන්නා කූඩුවෙන් තිබ්බා. කුරුළු අම්මයි තාත්තයි තරු දිහත්, අම්මගේ දිහා බලලත් ස්තුති කියන්න වගේ එයාලා වටේ කැරකිලා කූඩුවට ගියා. “පුතේ ආයෙ එහෙම ඔය වගේ වැඩ කරන්න එපා. මගේ දුව හොඳ දරුවෙක්නේ.” අම්මා කියලා තරු එක්ක ගෙට ගියා.

‘‘තරු.... ඔයා කුරුළු පැටව්ට ඇත්තටම ආදරේ නම්, එයාලට ජේන තැනක කුරුළු ලෑල්ලක් හදලා කෑම දාන්න’’ අම්මා කිව්වා. ‘‘හා අම්මේ මම එහෙම කරන්නම්’’ තරු කිව්වා. තරු තාත්තාටකියලා කුරුළු ලෑල්ලක් හදලා හැමදාම කෑම දැම්මා. කුරුළු අම්මටයි තාත්තටයි හරි සතුටුයි. පැටව් දාලා ‘‘ආය කෑම හොයා ගෙන යන්න ඕනේ නෑ. කුරුළු අම්මා කිව්වා.’’ ‘‘ඔව් අපිට ළමයි ලඟම ඉන්න පුළුවන් ’’ තාත්තා කිව්වා. කුරුළු පවුල වගේම තරුගේ පවුලේ අයත් ගොඩක් සතුටු වුණා. කුරුළු පවුල කෑම කන දිහා බලාගෙන තරු ගේ තාත්තා තරුට මෙහෙම කිව්වා. ‘‘පුතේ ඔයා ලොකු පිංකමක් කළේ එයාලට කෑම දීලා ඊට පස්සේ ඒ පවුල් දෙකම සතුටින් ජීවත් වුණා.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිපිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට<br>
සෙනෙවිරත්න මහලේකම්<br>
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ<br>
2023-10-20



**පී.පී. ලවන්‍යා ද සිල්වා.**

